# ප්‍රයිම් ලෑන්ඩ් රෙසිඩන්සිස් පීඑල්සී හි

## සියලුම කොටස් හිමියන් වෙත කෙරෙන දැනුම් දීමයි.

**සමාගමේ 16 වන වාර්ෂික මහා සභා රැස්වීම මාර්ගගථ ක්‍රමයට වන රැස්වීමක් ලෙස සැප්තැම්බර් මස 30 වන දින පස්වරු 2.30 ට පැවැත්වීම සම්බන්ධයෙන් කෙරෙන දැනුම් දීමයි.**

රට තුල දැනට බලපවත්නා ඇඳිරිනීතිය (රට වසාදැමීම) හේතුකොටගෙන ඉහත වාර්ෂික මහාසභා රැස්වීම පිළිබඳ දැන්වීම සමාගමේ කොටස්හිමියන් වෙත තැපෑලෙන් එවීමට නොහැකි වී ඇති බව කනගාටුවෙන් දන්වා සිටිමු. රටතුළ දැනට බලපවත්නා ඇඳිරිනීති තත්ත්වය/ රට වසා දැමීම අවසන් වූ වහාම අදාළ දැන්වීම සියලුම කොටස්හිමියන් වෙත තැපැල් මාර්ගයෙන් එවීමට කටයුතු කරන්නෙමු. කෙසේ වෙතත් සමාගමේ වාර්ෂික මහාසභා රැස්වීමට සහභාගී වීමේ කොටස්හිමියන් සතු සමාන ප්‍රවේශ අයිතිය සුරක්ෂිත කිරීමට මෙම දැන්වීම ප්‍රසිද්ධ කරන අතර, මෙය කොළඹ කොටස් හුවමාරු මධ්‍යස්ථාන වෙබ් අඩවිය වන (https://www.cse.lk/home/company-info/PLR.N0000/financial) සහ සමාගමේ වෙබ් අඩවිය වන (https://www.primeresidencies.lk/investor-relations) වෙත මෙම වාර්ෂික සමුළුව පිළිබඳ දැන්වීම (පහත දක්වා ඇති මාර්ගගථ ක්‍රමයට පවත්වනු ලබන වාර්ෂික මහාසභා රැස්වීම සඳහා ලියාපදිංචි වන ආකාරය සහ මාර්ගගථ ක්‍රමයට 2021 වාර්ෂික මහා සමුළුවට සහභාගී වීම-කොටස්හිමියන්ගේ විස්තර ලියාපදිංචිය (ලියාපදිංචි පෝරමය) ඊට අදාළ අනෙකුත් ලේඛන උඩුගත කොට ඇත.

**වාර්ෂික මහාසභා රැස්වීම පිළිබඳ දැන්වීම**

ප්‍රයිම් ලෑන්ඩ් රෙසිඩන්සීස් පීඑල්සී හි 16 වන වාර්ෂික මහාසභා රැස්වීම මාර්ගගථ ක්‍රමයට වන රැස්වීමක් ලෙස 2021 සැප්තැම්බර් මස 30 වන දින පස්වරු 2.30 ට පහත කරුණු සම්බන්ධෙයන් පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙමු.

**න්‍යාය පත්‍රය**

1. රැස්වීම පිළිබඳ දැනුම්දීම.
2. අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව සහ විගණකවරුන්ගේ වාර්තාව සමඟ සමාගමේ 2021 මාර්තු 31 වන දිනෙන් අවසන් වන වාර්ෂික ගිණුම් ප්‍රකාශය පිළිගැනීම සහ ඒ පිළිබඳව සලකා බැලීම.
3. සමාගමේ සාංගමික ව්‍යවස්ථාවේ 29(1) (ඉ) ව්‍යවස්ථාවට අනුව එම්.පෙරේරා මහතා සමාගමේ අධ්‍යක්ෂකවරයෙකු වශයෙන් පත්කරගැනීම.
4. සමාගමේ සාංගමික ව්‍යවස්ථාවේ 29(1) ඉ ව්‍යවස්ථාවට අනුව ඩී.එච්. කලපුගේ මහතා සමාගමේ අධ්‍යක්ෂකවරයෙකු වශයෙන් පත්කරගැනීම.
5. සමාගමේ සාංගමික ව්‍යවස්ථාවේ 29(1) ඉ ව්‍යවස්ථාවට අනුව එස්.එම්.එස්.එස්. බණ්ඩාර මහතා සමාගමේ අධ්‍යක්ෂකවරයෙකු වශයෙන් පත්කරගැනීම.
6. සමාගමේ සාංගමික ව්‍යවස්ථාවේ 29(1) ඉ ව්‍යවස්ථාවට අනුව ඩී. සූරියආරච්චි මහතා සමාගමේ අධ්‍යක්ෂකවරයෙකු වශයෙන් පත්කරගැනීම.
7. වරලත් ගණකාධිකාරීවරුන් වන බීඩීඕ පාට්නර්ස් හවුල්කරුවන් සමාගමේ විගණකවරුන් ලෙස ඉදිරි වර්ෂය සඳහා නැවත පත්කර ගැනීමට සහ ඔවුන්ගේ වේතන සම්බන්ධෙයන් තීරණ ගැනීම අධ්‍යක්ෂවරුන්ට බලය පැවරීම.
8. 2021/2022 වර්ෂයේ පුණ්‍ය කටයුතු සහ අනෙකුත් ආධාර සම්බන්ධයෙන් වන තීරණයන් ගැනීම සම්බන්ධයෙන් සමාගෙම් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත බලය පැවරීම.

සමාගෙම් අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි
**ප්‍රයිම් ලෑන්ඩ්ස් රෙසිඩන්සීස් පීඑල්සී**
පෙලේ කන්සල්ටින් (ප්‍රයිවට්) ලිමිටඩ්
(අත්සන් කරන ලදී)
සමාගම් ලේකම්වරු
දිනය: 2021 ක් වූ සැප්තැම්බර් මස 07 වන දින දීය.

PRIME LANDS RESIDENCIES PLC
COMMITTED TO CREATING A BETTER PLACE ON EARTH